www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මාක්ස්වාදය, ඉතිහාසහ සහ සමාජවාදී විඥානය

## *14-16 පරිච්ඡේද*

**Marxism, History & Socialist Consciousness**
**Chapters 14-16**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**

*හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශන ආයතනය වන මේරිං බුක්ස් ඩේවිඩ් නෝර්ත් විසින් රචිත* Marxism, History & Socialist Consciousness *(මාක්ස්වාදය, ඉතිහාසය සහ සමාජවාදී විඥානය) නම් වූ නව ග්‍රන්ථයක් පල කර ඇත. එය දැන් අපගේ වෙබ් අඩවිය හරහා කෙලින් ම මිලදී ගත හැකි ය. එය රචනා කරන ලද්දේ එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්යේ පූර්වගාමියා වූ වර්කර්ස් ලීගයේ හිටපු සාමාජිකයන් වන ඇලෙක්ස් ස්ටයිනර් හා ෆ්‍රෑන්ක් බෙනර් විසින් හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ වැඩකටයුතු සම්බන්ධයෙන් කරන ලද* Objectivism or Marxism *(වෛෂයිකවාදය ද මාක්ස්වාදය ද) නම් වූ විවේචනයකට පිලිතුරු වසයෙනි.*

*අපි එම ග්‍රන්ථයේ පෙල කොටස් වසයෙන් පල කිරීම ආරම්භ කලෙමු. එහි පෙරවදන දෙසැම්බර් 10 දා පල වූ අතර 1. 2 හා 3 වන පරිච්ඡේද දෙසැම්බර් 11 දා ද 4 සිට 7 දක්වා පරිච්ඡේද දෙසැම්බර් 13 දා ද 8 සිට 10 දක්වා පරිච්ඡේද දෙසැම්බර් 15 දා ද 11 සිට 13 දක්වා පරිච්ඡේද දෙසැම්බර් 17 දා ද පල විය. 14 සිට 16 දක්වා පරිච්ඡේද පහත පල වේ. ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශන ආයතනය වන කම්කරු මාවත ප්‍රකාශකයන් විසින් මෙය සිංහල භාෂාවෙන් ග්‍රන්ථයක් ලෙස පල කරනු ලැබ ඇත.*

## 14. සමාජවාදීන් හා ජනතාව

බ්‍රෙනර් සහෝදරය, ඒ සමාන විඥානවාදී සංකල්පයන් මත පදනම්ව කටයුතු කරන ඔබ ඉහත ප්ලෙඛානොව් විසින් ඉදිරිපත් කරන ලද "ක්‍රිටිකල් ක්‍රිටික්ස්"වරුන්ගේ ආස්ථානයේ සංක්ෂිප්තයට සිත් කාවදින ලෙස සමාන වූ සමාජවාදීන් සහ ජනතාව අතර සම්බන්ධතාවය පිලිබඳ සංකල්පයකට එලඹී ගන්නෙහි ය.

ඔබ මෙසේ ලියන්නෙහි යː "බීම්ස්ට අනුව සමාජවාදී සමාජය දුවවනු ඇත්තේ සමාජවාදීන් නො ව ජනතාවයි, ඉතින් පවුල, වැඩ, පරිසරය, යනාදී ප්‍රයුක්තියන් පිලිබඳව සමාජවාදී පිලිවෙත්වලින් - ඔහු මෙය සඳහන් කරන්නේ 'වට්ටෝරු' යනුවෙන් අවමානකාරීවය - පලක් ඇත්තේ නැත. සමාජවාදී සමාජ සමාප්තියක් කෙබඳු වේ ද යන්න පිලිබඳ සමවාය දෘෂ්ටියක් ගැන කියනුම කවරේ ද? මෙහි එක් මූලික සත්‍යයක් කියැවෙයි. එනම්, කම්කරු පන්තිය තමාම විමුක්ත කර ගත යුතු බවය. එය සමාජවාදී ව්‍යාපෘතියට අති මූලික වෙයි. එහෙත් මීට පෙර කවර කලෙකවත් සමාජවාදීන්ට ක්‍රියාමාර්ගයක් අවශ්‍ය නැත යන්න අදහස් කිරීමට මෙය අර්ථ කථනය කර නැත."

යලිත් වරක් ඔබ විවාදාත්මක වංචාවකට බැසගනියිː

"සමාජවාදී සමාජයක් සමාජවාදීන් විසින් 'දුවවනු' ලබන්නේ නැත, කලින් නියම කරන ලද 'වට්ටෝරු' නොමැතිව, නව සමාජ රූපයන් හැඩ ගස්සා ගැනීම ස්වයං-විමුක්ති ක්‍රියාවලිය තුල දී කම්කරු පන්තිය විසින් ඉටු කර ගත යුතු කර්තව්‍යයක් ය"යි බීම්ස් කල ප්‍රකාශය ක්‍රියාමාර්ගය ප්‍රතික්ෂේප කිරීමක් ලෙස වැරදි ලෙස අර්ථකථනය කරනු ලැබ තිබේ.

"මහා ජනතාව තමන්ව විමුක්ත කර ගැනීම සහ සමාජවාදීන් රාජ්‍යය දිවවීම අතර ප්‍රතිඝතිතාවක් නැතැ" යි ඔබ අවධාරනය කරන්නෙහි ය. ඔබ, කොමිසාර් බ්‍රෙනර් මෙසේ කියන නිසා මහජනතාව මෙය පිලිගන්න ද? කම්කරු පන්තිය තමන්ම විමුක්ත වී ගැනීම යනුවෙන් අදහස් වන්නේ එක්කෝ මහජනතාව තමන්ගේ ම විමුක්තියේ රූපා'කෘතීන් තනාගත යුතු ය, යන්න ය, නැත හොත් මහජනතාව එය කරන්නේ නැත. මෙය වනාහි හුදෙක් වියුක්ත න්‍යායික ආසක්තයක් පිලිබඳ ප්‍රයුක්තියක් නො වේ. මෙහි දී ගැටලුව හුදු ඉදිරිපත් කිරීම ම වුව සෑහේː බලය අත්පත් කර ගැනීමෙන් ඉක්බිති විප්ලවවාදී සමාජවාදී ආන්ඩුවක් කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයට විෂයය වනු ඇති ද? ප්‍රතිපත්ති සම්පාදනය සිදුවනු ඇත්තේ පාලක සමාජවාදීන් විසින් අනවනු ලබන නියෝග පදනම් කොට ගෙන ද, නැත හොත් ස්වකීය දෘෂ්ටිකෝනයන් හා පිලිවෙත් සඳහා සටන් කිරීමට ඇති අයිතිය ප්‍රජාතාන්ත්‍රික අයිතීන් අතර වඩාත් මාහැඟි වූත් ඉතා උද්යෝගයෙන් සුරකින්නා වූත් අයිතිය වන, පුලුල් සමාජ ප්‍රවනතාවන් අතර විවෘත අරගලය හරහා ද?

මෙම ප්‍රශ්නවලට ඔබ දෙන පිලිතුර සිතා ගැනීමට නම් විප්ලවයෙන් පසු තතු සිදුවන ආකාරය පිලිබඳ ඔබේ විස්තරය කියැවීම සෑහේː

"ඇතැම් කම්කරුවන් විප්ලවයට ක්‍රියාකාරීව විරුද්ධ වනු ඇතඃ සමාජවාදී සමාජයක් තුල කිසිවක් ඔවුන් විසින් දුවවනු ඇතැයි සිතීම ම අගතියකි. අන්‍යයෝ දේශපාලනිකව මධ්‍යස්ථ වනු ඇත්තාහඃ තමන් විසින් වටහා ගනු ලැබීමට යත්නමින් පටන් ගැනුනු විප්ලවයක වගකීම් එක වරම ඔවුන් මත පැටැවීම, ඔවුන් සතුරු කර ගැනීමට වඩා වැඩි යමක් ඉටු කරනු නැත. ඔවුන්ගේ දේශපාලන විඥානය (සහ වඩාත් පුලුල්ව, ඔවුන්ගේ සාමාන්‍ය සංස්කෘතික මට්ටම) ඉවසිල්ලෙන් පෝෂනය කල යුතු ය. එ බැවින්, සැලකිය යුතු කාල පරිච්ඡේදයක් තුල, සමාජවාදී සමාජය දිවැවීම පවතිනු ඇත්තේ පන්ති විඥානයෙන් යුත් කම්කරුවන් - වෙනත් වචනවලින් කිව හොත් කම්කරු පන්තිය තුල, ස්වකීය දේශපාලන විඥානය විප්ලවවාදී සමාජවාදී ව්‍යාපාරය විසින් හැඩ ගස්වනු ලැබූ කොටස (අත්‍යවශ්‍යයෙන් ම එහි සැලකිය යුතු විශාල කොටසක් හා අපේක්ෂා සහගතව එහි බහුතරය) - අත විනා අරූප "මහජනයා" අත නො වේ. "සමාජවාදීන් සමාජය දිවැවීම" යන්නෙන් අදහස් කරන ලද්දේ මෙය බැව් මා අවධාරනය කල යුතු ය. - පක්ෂ නිලධරයේ කුඩා කල්ලියක් නො ව සමාජවාදී විඥානයෙන් සපිරුනු පලල් කම්කරු කොටසක්."

සමාජවාදී ආන්ඩුවක් විසින් මුහුන දෙනු ඇති තත්වය පිලිබඳ ඔබේ දැක්ම කියවන්නෙකුට සිනාසෙන්නට ද නැතහොත් අඬන්නට දැයි සිතා ගත නොහැකි ය. කම්කරු පන්තියේ බහුතරයක් (පැහැදිලිව ම සමස්ත ජනගහනයෙන් බහුතරයක් නොවන නමුදු) විප්ලවයට සහය දෙතැයි ඔබ අපේක්ෂා සහගත වෙතත්, සමාජවාදීන් අඩුතරමින් ඔවුන් ජනතාව විමුක්ත කිරීමට යොදවන තරම් ම කාලයක් ඔවුන් මැඩීමට ද යොදවනු ඇති බව පිලිබඳව ඔබට කිසිත් ගැටලුවක් නැත්තා සේ ය. තව ද, ඔබ විරුද්ධත්වය හෝ අපක්ෂපාතීත්වය අපේක්ෂා කරන කම්කරු පන්තියේ ඔය සියලු කොටස් "කිසිවක් හෝ දිවැවීමෙන්" තොරව තැබුවහොත්, දියුනු සමාජයක ආර්ථික, තාක්ෂනික හා සමාජයීය යටිතල පහසුකම්හි වැදගත් කොටසක අඛන්ඩ ක්‍රියාකාරිත්වය; සැර බාල කොට කිවහොත්; ගැටලු සහගත වනු ඇත. හුදු දේශපාලන කාරනාවන්හි පදනම මත පමනක් තීරනය කල හැකි දැයෙහි සීමාවන් පවතී. බලය දිනා ගැනීමෙන් අනතුරුව සමාජවාදී කම්කරු ආන්ඩුවකට, සිය දේශපාලන පිලිගැනීම් කවරාකාරයේ වුව, සමාජයේ යටිතල පහසුකම් තුල තීරනාත්මක කාර්ය කොටසක් දිගටම ඉටු කරන මිනිසුන් විශාල සංඛ්‍යාවකගේ උද්යෝගිමත් සහයෝගය අවශ්‍ය වනු ඇත. මේ මිනිසුන්ට ඒ හෝ මේ ආඥාවන් පැනවීමට සමාජවාදීන්ට - ඉදින් ඔවුන් එසේ කිරීමට නැඹුරු වුවත් - නොහැක්කේ ම ය. ඔවුන්ට ඇහුම්කන්දීමට ද, එ පමනක් නොව ඔවුන්ගේ අත්දැකීම් හා විශේෂඥ දැනුමට නිසි ගෞරවයෙන් යුතුව සැලකීමට ද සිදුවනු ඇත.

අනාගත සමාජවාදී සමාජය සඳහා වූ වට්ටෝරු මවා ලීමෙහි ඒ සා උන්මාදනීයව ගැලී හුන්න ද, ධනවාදයේ සිට සමාජවාදය කරා වූ පරිවර්තනයේ ගැටලු පිලිබඳව ඔබ එතරම් සිතා මතා ඇති බවක් නොපෙනේ. සමාජවාදය වූ කලී හුදු එහි ස්වභාවය අනුව මහජනයාගේ ජීවිත කෙරේ බලපැවැත්වෙන සියලු ප්‍රයුක්තීන් සම්බන්ධ තීරන සඳහා වන මහජන සහභාගිත්වයෙන් තොරව - එ නම්, ප්‍රජාතන්ත්‍රවාදයේ දැවැන්ත ප්‍රසාරනයකින් තොරව - සාක්ෂාත් නො කල හැක්කකි. කාල් මාක්ස්ගේ *The Class Struggle in France* (ප්‍රන්සයේ පන්ති අරගලය) කෘතියට 1895 මැයි මස ලියූ (තම අභාවයට යන්තම් තෙමසකට ඉහත දී සම්පූර්න කරන ලද) හැඳින්වීමෙහි එංගල්ස් ඒ සා විශිෂ්ට ලෙස පල කල පරිදිඃ

"සවිඥානක භාවයෙන් හීන වූ මහජනයාගේ ශිරෂකයෙහි වන කුඩා සවිඥානක සුලුතරයක් විසින් කරනු ලබන අනපේක්ෂිත ප්‍රහාරයන්ගේ විප්ලව අතීතයට එක් වී ඇත. එය සමාජ සංවිධානයේ පරිපූර්න පරිවර්තනයක් පිලිබඳ ගැටලුවක් වූ කල් හි, මහජනතාවෝ තුමූ ම ද එහි නියැලී සිටිය යුත්තා හ; අවදානමට ලක් වී ඇත්තේ කුමක් ද, තමන් සටන් වදින්නේ කුමක් සඳහා දැයි සිය සකල ශරීරයෙන් හා ආත්මයෙන් ඒ වන විටත් ග්‍රහනය කර සිටිය යුත්තාහ. පසු ගිය පනස් වසරක ඉතිහාසය අපට එය උගන්වා ඇත." [*Marx Engels Collected Works*, volum 27 (මාක්ස් එංගල්ස් සංගෘහිත කෘති); 27 වන වෙලුම, මොස්කව්, 1990; 520 පි.].

වෙනත් වචනවලින් කිව හොත්, විප්ලවය කම්කරුවන් උදෙසා නිර්මානය කල හැක්කක් නො වේ. එය තමන් සටන් කරන්නේ කුමක් සඳහා දැයි වටහා ගෙන සිටින කම්කරුවන් විසින් නිර්මානය කරනු ලැබේ. කම්කරු පන්තිය දේශපාලන බලය සඳහා සටන් වැදීමට හා එය දිනා ගැනීමට ද සමත් ය යන සංකල්පය යුක්තියුක්ත වූවක් සේ පෙනී යන්නේ, කම්කරු ජනයා තමන්ගේ ම ජීවිතවල අත්දැකීම් තුලින් සමාජවාදයේ ඉදිරි දර්ශනයට ඇදී එතැයි විශ්වාස කරන්නන්ට පමනෙකි. එහෙත් බ්‍රෙනර් සහෝදරය, ඔබ මෙය විශ්වාස නො කරන්නෙහි ය. මහජනයා තුල ඔබට පෙනෙන්නේ අශෝභන පසුගාමිත්වයේ දසුනක් පමනි. ඔබ මෙසේ ලියන්නෙහි යඃ "හුදු විප්ලවයකට සහභාගි වීමෙන් පමනක් අවශේෂ මහජනයාට ජීවිත කාලයක මර්දනය හා පසුගාමිත්වය ඉක්මවා සමාජවාදය තමන් විසින් ම ඉදිකිරීමේ දැවැන්ත එල්ලය සපුරා ගත හැකි තරමට තමන්ගේම සමින් එලියට පැන ගත හැකිනම්, එනම්, සමාජවාදීන්ගෙන් කිසිත් මග පෙන්වීමක් හෝ 'වට්ටෝරු' නො ලබා ඔවුන්ට එසේ කල හැකි නම්, විප්ලවයක් ඇති කිරීම සඳහා ඔවුන් මෙහෙයවීමට මෙකී සමාජවාදීන් ම ඔවුන්ට අවශ්‍ය වන්නේ මොන එකකට දැයි යමෙකුට මවිතයක් ඇති වේ. කොටින්ම ඔවුන්ට විඥානයේ වෙනසක් අවශ්‍ය මන්දැයි යමෙකුට ඇතිවන්නේ විමතියකි."

කම්කරුවෝ පසුගාමීව විප්ලවයට ප්‍රවිශ්ඨ වෙති. පසුගාමීව ම ඔවුහු ඉන් නික්මෙති. මේ සාමාන්‍ය

මහජනතාව කෙරේ ඇති රැක ගත යුතු යමක් වේ ද එය රැක ගනිමින්, නව යුතෝපියාව කරා ඔවුන් නොතකා ඔවුන් මෙහෙයවිය හැක්කේ ෆ්‍රැන්ක් බ්‍රෙනර්ගේ යෝධ ව්‍යායාමය හරහා පමනෙකි.

## 15. විඥානය සහ සමාජවාදය

වාසනාවකට මෙන් සැබෑ ඓතිහාසික සන්තතිය ඉදිරියට යන්නේ වෙනස් ආකාරයකිනි. විප්ලවය පුපුරා යාමට අවශ්‍යයෙන් ම පෙරටු වන්නා වූ සමාජ විඥානයේ පරිවර්තනය සහ ඉක්බිතිව පැන නගින මහා අරගල තුල දී එහි ඇතිවන්නා වූ විකාශනය පෞද්ගලික විඥානයට නිරාධීනව වර්ධනය වන්නා වූ සමාජ-ආර්ථික සන්තතීන් තුල මුල් බැස පවතින්නේ ද ඒවායේ ප්‍රකාශනය වන්නේ ද වේ.

එතකුදු නො ව, විප්ලවවාදී අරගලයන්ගේ කාල පරිච්ඡේදයක් විලක්ෂනය කරන්නා වූ විඥානයේ යෝධ "පිම්", බෙහෙවින් කල් පමා වූ (එහෙයින් පුපුරා යන සුලු වූ) ක්‍රියාවලියක් වන සමාජ චින්තනය බාහිර සමාජ යථාර්ථය සමග යලි එකෙලි කිරීමක් නියෝජනය කරයි.[18] මහා ජනතා අරගලයන්ගේ අත්දැකීම මිනිසුන් ද ඔවුන්ගේ විඥානය ද විපර්යාස කරයි. 1840 ගනන්වල සිටි බ්‍රෙනර්ලාට පිලිතුරු දෙමින් මාක්ස් සහ එංගල්ස් ලියා තැබූ පරිදි:

> "මහා පරිමානයෙන් මෙම කොමියුනිස්ට් විඥානය නිෂ්පාදනය කිරීම සඳහා පමනක් නො ව, ව්‍යාපාරයේ ජයග්‍රහනය සඳහා ම ද මනුෂ්‍යයින් මහා පරිමානව පරිවර්තනය කිරීමක් අවශ්‍ය ය; එම පරිවර්තනය වනාහි ප්‍රායෝගික මහා චලනයක්, *විප්ලවයක්* තුල ම පමනක් සිදුවිය හැක්කකි; විප්ලවය අවශ්‍ය වන්නේ, එහෙයින්, *පාලක* පන්තිය වෙනත් කුමන ආකාරයකින් හෝ පෙරලා දැමිය නොහැකි නිසා පමනක් නො වේ, එම *පෙරලා දැමීම* ඉටු කරන පන්තියට යුග ගනනාවක් තිස්සේ තමන් මත ගොඩගැසුනු දහ ජරාවෙන් අත්මිදී සමාජය නව්‍යව පුනර් නිර්මානය කිරීමේ කර්තව්‍යය උදෙසා සුදුසු වී ගත හැක්කක් ද විප්ලවයක් තුලින් ම පමනක් හෙයිනි." [*Marx Engels Collected Works*, volume 5 (මාක්ස් එංගල්ස් සංගෘහිත කෘති); 5 වන වෙලුම, නිව් යෝර්ක්, 1976; 52-53 පිටු. අවධාරනය මුල් කෘතියේ.]

සහේතුකව ම කීර්තිමාන වූ මෙම ඡේදය මාක්ස් සහ එංගල්ස් විසින් 1845 දී එක්ව ලියන ලද *The German Ideology* (ජර්මන් දෘෂ්ටිවාදය) නම් කෘතියේ අන්තර්ගත වේ. මෙම කෘතිය මිනිසාගේ සමාජ පැවැත්ම ඔහුගේ සමාජ විඥානය උඩ විග්‍රහ කරනවා වෙනුවට ඔහුගේ සමාජ විඥානය සමාජ පැවැත්ම මත විග්‍රහ කලා වූ ඉතිහාසය පිලිබඳ භෞතිකවාදී සංකල්පයේ ප්‍රථම විස්තාරනය විය. මිනිසාගේ චින්තනයේ රූපයන් වර්ධනය වන්නේ වෛෂයික භෞතික පදනමක බව ඔව්හු (මාක්ස් හා එංගල්ස්) සොයා ගත්තාහ. "ජීවිතය තීන්දු කරන්නේ විඥානය විසින් නො ව, විඥානය තීන්දු කරන්නේ ජීවිතය විසින් ය" (එම 37 වන පිටුව) ඉතිහාසයේ සහ විඥානයේ වර්ධනය පිලිබඳ මෙම නව සංකල්පය "රැදී පවත්නේ ජීවිතයේ භෞතික නිෂ්පාදනයෙන් අරඹා - මෙම නිෂ්පාදන විධිය, විසින් නිර්මානය කරනු ලැබූ හා ඒ හා සම්බන්ධ මානව අන්තර් සම්බන්ධතා ස්වරූපය, හෙවත් විවිධ අවස්ථාවන්හි පවත්නා වූ සිවිල් සමාජය සකල ඉතිහාසයේ පදනම ලෙස වටහා ගනිමින් - නිෂ්පාදනයේ යථා සන්තතිය විස්තාරනය කිරීම උඩ" ය. (එම, 53 පිටුව)

සමාජ විප්ලවය වනාහි පැනනගිමින් පවත්නා වූ ධනේශ්වර පද්ධතිය තුල සැබෑ සමාජ-ආර්ථික ප්‍රතිසතිතාවන්ගේ වෛෂයික නිර්මානයක් යන මෙම සංකල්පය ඉතිහාසය පිලිබඳ සියලු විඥානවාදී අර්ථ කථනයන්ට මරනීය ප්‍රහාරයක් එල්ල කලේ ය. එපමනක් නො ව, සමාජය තුල විප්ලවවාදී බලවේගයක් ලෙස ධනවාදයේ "මිනීවල කපන්නා" ලෙස කම්කරු පන්තියේ ම වර්ධනය වෛෂයික සන්තතියක් විය. එහි ලෝක-ඓතිහාසික භූමිකාව නීර්නය කරනු ලැබුවේ, ඉතාම අතිමූලික අර්ථයෙන් ගත් කල්හි, එහි විඥානයෙන් නො ව ධනේශ්වර නිෂ්පාදන විධිය තුල එය (කම්කරු පන්තිය) දරන්නා වූ ඒකමාත්‍ර ස්ථානයෙනි. කම්කරු පන්තිය විප්ලවවාදී බලවේගයක් ය යන සංකල්පනයට එරෙහි අතිශයින්ම ජන්මාන්තර වූ විරුද්ධත්වයට - එනම්, කම්කරු පන්තියට විප්ලවවාදී විඥානයක් නැතැ යි ද, එයට විප්ලවය උවමනා නැතැ යි ද යන්නට - පිලිතුරු දෙමින් *The Holy Family* (ශුද්ධ වූ පවුල) නම් කෘතියේ මාක්ස් සහ එංගල්ස් මෙසේ පැවසූහ:

> "මෙය වනාහි ඒ හෝ මේ කම්කරු පන්තිකයා, හෝ සමස්ත කම්කරු පන්තිය ම, දෙන ලද මොහොතේ තම අරමුන කුමක් දැයි සලකන්නා වූ දෙය පිලිබඳ ප්‍රශ්නයක් නො වේ. එය, කම්කරු පන්තිය යනු කුමක් ද හා එහි එම පැවැත්මට අනුව ඊට ඓතිහාසිකව කරන්නට සිදු වී ඇත්තේ කුමක් ද යන්න පිලිබඳ ගැටලුවකි. එහි (කම්කරු පන්තියේ) අරමුන සහ ඓතිහාසික ක්‍රියාව එහිම ජීවන තත්වය තුල ද අද දින ධනේශ්වර සමාජයේ සමස්ත සංවිධානය තුල ද දෘෂ්‍යමානව සහ අනිවාරනීයව ම පෙර ඇඟවී පවතින්නේ ය." [*Marx Engels Selected Works*, volum 4 (මාක්ස් එංගල්ස් තෝරාගත් කෘති); 4 වන වෙලුම, නිව් යෝර්ක්, 1975; 37 පිටුව. අවධාරනය මුල් කෘතියේ.]

විඥානයේ භූමිකාව පිලිබඳ සියලු මාක්ස්වාදී සාකච්ඡාවක් ම - සමහර විට මෙය බ්‍රෙනර් සහෝදරයා විසින් වටහා ගෙන නැති වියහැකි වුව ද ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයට සැලකිය යුතු ආසක්තතාවක් පැවැතී ඇත්තා වූ මාතෘකාවකි මෙය - ආරම්භ කල යුත්තේ සමාජ-ආර්ථික වර්ධනයේ භෞතික සන්තතියට එය (විඥානය) කෙසේ සම්බන්ධ වී පවතී ද යන්න පිලිබඳ නිවැරදි වැටහීමකිනි. විප්ලවවාදී පක්ෂයක් ගොඩ නැගීමේ ද සමාජවාදී විඥානය වර්ධනය කිරීමේ ද සැලසුම් සමග එම අරමුනු ජය ගැනීම සඳහා ඉඩ සලස්වන්නා වූ

වෛෂයික කොන්දේසි නො පවතින්නේ නම්, එවන් සැලසුම් නිරර්ථක වනු ඇත. ඉතිහාසය පිලිබඳ භෞතිකවාදී සංකල්පය විස්තාරනය කිරීම මිනිසා විසින් තමාගේ ම සමාජ භාවිතය ද (තමාගේ ම) විඥානය ද වටහා ගැනීමේ දැවැන්ත ඉදිරි පියවරක් සලකුනු කලේ ය. එංගල්ස් පැහැදිලි කල පරිදි "සකලවිධ සමාජ විපර්යාසයන්ගේ ද දේශපාලන විප්ලවයන්ගේ ද අන්තිම හේතුව සොයාගත හැකි වන්නේ මිනිසුන්ගේ මොලය තුල නො ව, සනාතනික සත්‍යය සහ යුක්තිය පිලිබඳ මිනිසාගේ වඩා ඉහල වැටහීම තුල හෝ නො ව, නිෂ්පාදන හා හුවමාරු විධීන්ගේ වෙනස්කම් තුල ය. ඒවා සෙවිය යුත්තේ එක් එක් යුගයේ *දර්ශනවාදය* තුල නොව, *ආර්ථිකය* තුල ය." [*Marx Engels Collected Works*, volume 24 (මාක්ස් එංගල්ස් සංගෘහිත කෘති); 24 වන වෙලුම, ලන්ඩන්, 1989; 306 පිටුව] "දේවල් වෙනස් විය යුතු ය" යන "හැඟීමක්" සමාජයේ පුලුල් කොටස් තුල පැන නැඟීම ම පවත්නා දේශපාලන සහ ආර්ථික පද්ධතියේ යල්පිනූ ස්වභාවය සමාජ විඥානය තුල පිලිබිඹුවීමක් වේ.[19]

සමාජවාදී ව්‍යාපාරයක් පැන නැඟීමට වෛෂයික පදනමක් පවතී යයි වටහා ගැනීම සමාජවාදී විඥානය වර්ධනය කිරීමේ අරගලයේ වැදගත්කම අඩු කර දමන්නේ නැත. සැබැවින්ම, සමාජවාදයේ වෛෂයික පදනම පැහැදිලි කිරීම ම කම්කරු පන්තිය න්‍යායිකව අධ්‍යාපනය කර ගැනීමේ තීරක සංරචකයකි. එහෙත් සමාජවාදී ව්‍යාපාරයේ අධ්‍යාපක කර්තව්‍යයන් නිවැරදිව සූත්‍රගත කිරීම ම ශක්‍ය වන්නේ ධනවාදයේ ප්‍රතිසතිතාවන් විප්ලවවාදී විඥානයේ වර්ධනය සඳහා තීරනාත්මක ආවේගය සම්පාදනය කරන්නේ ය යන වැටහීමක රාමුව තුල වේ.

සමාජවාදී විඥානය පිලිබඳ ගැටලුව, එම විඥානය සැබෑ සමාජ-ආර්ථික සත්තතියක පරමාදර්ශී පිලිබිඹුවක් යයි වටහා ගන්නා අයට ඉදිරිපත් වන්නේ එක් ආකාරයකට ය; ධනේශ්වර සමාජයේ ආර්ථික අත්තිවාරම් සහ සමාජ චින්තනය නිර්මානය කිරීම අතර එවන් වෛෂයිකව අවශ්‍ය සම්බන්ධතාවයක් ඇත්තේ නැතැ යි සිතන්නා වූ අයට එය ඉදිරිපත් වන්නේ ඊට මුලුමනින් ම වෙනස් වූ ආකාරයකට ය. මාක්ස්වාදීන්ට සමාජවාදී විඥානය උදෙසා අරගලය වනාහි ධනවාදයට එරෙහි අරගලයක් කල යුතු යයි පලල් කම්කරු ජනයා ඒත්තු ගන්වාගැනීම පිලිබඳ කාරනයක් නො වේ; ඒ වෙනුවට එවන් අරගලයක් ධනේශ්වර පද්ධතියේ ගැඹුරුවන්නා වූ ආර්ථික හා සමාජ අර්බුදය තුලින් උග්‍ර කෙරුනු වෛෂයිකව සූරාකන්නා වූ අතිරික්ත-ශ්‍රම අපග්‍රහනයේ සත්තතිය තුලින් අනිවාර්යයෙන් ම පැන නගින බව වටහා ගන්නා මාක්ස්වාදී ව්‍යාපාරය ඉතිහාසය නියාම පාලිත සන්තතියක් ලෙස විද්‍යාත්මක වැටැහීමක් ද ධනේශ්වර නිෂ්පාදන විධිය සහ එය විසින් පැනනංවනු ලබන සමාජ සම්බන්ධතාවන් පිලිබඳ ඥානයක් ද වර්තමාන අර්බුදය හා එහි ලෝක-ඓතිහාසික ගම්‍යයන් පිලිබඳ අභිනිවේෂයක් ද කම්කරු පන්තියේ දියුනු කොටස් තුල වර්ධනය කිරීමට යත්න දරයි. මෙය වනාහි නො දැනුවත් ඓතිහාසික සන්තතියක් දැනුවත් දේශපාලන ව්‍යාපාරයක් බවට ප්‍රතිවර්තනය කිරීම පිලිබඳ ප්‍රශ්නයකි; ලෝක ධනේශ්වර ක්‍රමයේ අර්බුදයේ උග්‍රවීමේ ප්‍රතිවිපාක පූර්වාපේක්ෂා කිරීමේ ද ඒ සඳහා සූදානම් වීමේ ද, සිද්ධීන්ගේ තර්කනය එලිදරව් කරලීමේ ද, ඒවාට සරිලන්නා වූ දේශපාලන ප්‍රතිචාරයක් මූලෝපායිකව ද සහ උපායිකව සූත්‍රගත කිරීමේ ද ප්‍රශ්නයකි.

එහෙත් ධනවාදය විසින් ම නිර්මිත වෛෂයික සාධක තුල සමාජවාදයට පදනමක් දැක නො ගන්නා වූ ද පරාජයන් හා පසුබෑම්වල අත්දැකීම්වලින් දිරිසුන් වූවා වූ ද ධනේශ්වර අර්බුදයේ ස්වභාවය වටහා ගන්නේ ද නැති, කම්කරු පන්තියේ විප්ලවවාදී විභවය තේරුම් ගන්නේ ද නැති අයට නම් විඥානය ප්‍රතිවර්තනය කිරීම පිලිබඳ ප්‍රශ්නය පෙනී යන්නේ සාරභූත වසයෙන්ම මනස්කාරවාදී පමනක් නො ව මනෝවිද්‍යාත්මක ප්‍රශ්නයක් ලෙස ය. සමාජවාදී විඥානයට සැබෑ පදනමක් නො පවතින තාක් දුරට එවැන්නක් වර්ධනය වීමේ ශක්‍යතාව සොයාගත යුතු වන්නේ වෙනත් කිසියම් තැනක ය. බ්‍රෙනර් සහ ස්ටයිනර් සහෝදරවරුනි "සමාජවාදී සංස්කෘතියේ පුනර්ජීවනයක් සඳහා යුතෝපියාව තීරනාත්මකය" යි ඔබ විශ්වාස කරන්නේ හරියටම අන්න ඒ නිසා ය.

## 16. පවුල සහ පසුගාමිත්වය පිලිබඳව බ්‍රෙනර්

බ්‍රෙනර් සහෝදරය සමාජවාදී ව්‍යාපාරයක් ගොඩනැගීම සඳහා ඔබට යථාසම අසාධ්‍යම බාධාව ව පවතින්නේ මානව සන්තාපය ඇදවැටී පවත්නා ක්ෂතීභූත තත්වයයි. ඔබගේ විශ්වාසය අනුව මෙයට හේතුව වන්නේ විඥානය මත පවුල ඇති කරන්නා වූ බලපෑම යි. එහෙයින් සමාජවාදී විඥානය වර්ධනය කිරීම දෙසට මොනයම් මැ හෝ සැබෑ ප්‍රගමනයක් අත්කර ගැනීමට නම්, මෙම (පවුල්) සංස්ථාව සමග දෙකින් එක බේරාගැනීමට වැඩ සටහනක් වර්ධනය කර ගත යුතු වන අතර එය පක්ෂ වැඩ කටයුතුවල කේන්ද්‍රය බවට පත් කර ගත යුතුව තිබේ. " සමාජවාදීන්ට පවුල පිලිබඳ ක්‍රියා මාර්ගයක් අවශ්‍ය ද, නැත් ද යන්න ගැන විවාද කිරීමට සිදු විය යුතු නැතැ" යි ඔබ පුදුමයෙන් ප්‍රකාශ කරන්නෙහි ය. "අප දැන් සටන් වැද සිටින්නේ මිනිසුන්ට ඉතිහාසයේ ප්‍රථම වරට මනුස්ස ජීවිත ගත කිරීමට හැකි වන්නා වූ ලෝකයක් නිර්මානය කිරීමට වන හෙයින් දරුවන් සමාජීකරනය - එනම් මානුෂිකකරනය - කිරීමේ වගකීම භාර වූ ද පන්ති සමාජය තුල මානව පෞරුෂය මත මුල්ම හා ගැඹුරු ම තුවාලයන් ඇති කරන්නා වූ ද සංස්ථාව මුලුමනින් ම උඩුයටිකුරු කර පෙරලා දැමීමකින් තොරව, මෙම අරමුන ජය ගත හැකැ යි සිතීමට වත් නොහැකි ය." පවුල නියෝජනය කරන්නේ "ලිංගික පීඩනය සහ පසුගාමිත්වය" යි ඔබ කියන්නෙහි ය; "මෙම පරම

ගැටලුව ඇමතීමට බීම්ස්ගේ නොහැකියාව "සරලව ම විශ්වාසාතික්‍රාන්ත" වේ ල. "මිනිසුන් තම පෞද්ගලික ජීවිත ජීවත් විය යුත්තේ කෙසේ දැ" යි අනපැනවීම සමාජවාදීන්ගේ වැඩක් නො වේ ය" යි ඔබ අපට සහතික කරන අතර බීම්ස්, විඥානයේ වර්ධනයට පවුල පටවා තිබෙන බාධා ජයගැනීමට "ගත යුතුව පවත්නා වූ පියවරයන් මුලුමනින් ම නො තකා හරින්නේ ය" යි ඔබ සන්ත්‍රස්තයට නො අඩු තත්වයකට පත්වන්නෙහි ය. සමාජවාදීන්ට, "පසුගාමීත්වයට එරෙහිව ද ලිංගික පීඩනයට එරෙහිව ද ක්‍රියාමාර්ගික ඉල්ලීම්වල සිට සාමූහික පවුලක අරමුන සහ සමාජවාදය යටතේ පෞද්ගලික ජීවිතයේ ස්වභාවය පිලිබඳ අධ්‍යාපනික ද්‍රව්‍ය ද ඇතුලත් පවුල පිලිබඳ වූ බොහෝ දේවල් ප්‍රකාශ කිරීමට තිබිය යුතු" යයි ඔබ අවධාරනය කරන්නෙහි ය.

(ඔබට අනුව) විප්ලවවාදි ව්‍යාපාරය, පවත්නා න්‍යෂ්ටික පවුලට විකල්පයක් ඉදිරිපත් කිරීම සඳහා කැප කිරීමට බීම්ස් අසමත්වීම බව, "සමාජවාදී ලෙයිසෆෙයාර්වාදයක් (අසම්බන්ධවාදයක්)'' වේ. පවුල "සමාජවාදී සමාජය තුල පැනනැගී නිරන්තරව විකාශනය වන්නා වූ ආර්ථික හා සමාජ සංවිධානයේ රූපයන්ගේ පදනම මත" වර්ධනය වනු ඇතැ යි යන බීම්ස්ගේ ප්‍රකාශය ප්‍රතික්ෂේප කරමින් ඔබ මෙසේ පිලිතුරු දෙන්නෙහි යඃ "කෙසේ වෙතත්, සමාජවාදය යන්නෙහි මුඛ්‍ය අර්ථය නම්, ඉතිහාසයේ ප්‍රථම වතාවට මනුසතුන් පවුල ද ඇතුලු එම විපර්යාසයන් දැනුවත්ව මෙහෙයවනු ඇතැ" යි යන්න ය.

ඔබ ඉදිරිපත් කරන කෝකටත් තෛලය වනාහි වරෙක විල්හෙල්ම් රීක් "පවුල්-රෝගය" යි නම් කල එතරම් විශාල ප්‍රමානයක් ගැඹුරු හා අසාධ්‍ය මානසික ගැටලු වගා කරන්නා වූ ද චිත්තවේගී වසයෙන් අඩිබර පටවන ලද්දා වූද බලාත්කාර පවුල් සම්බන්ධතා නමැති ඒ හුස්ම හිරකර දමන වාතාවරනය බිඳගෙන එලියට පැන ගැනීමට දරුවන් සහ දෙමාපියන් යන දෙගොල්ලට ම හැකි කරන්නා වූ සාමූහික පවුලයි." " සාමූහික පවුල" පිහිටුවන්නට යන්නේ කෙසේ ද යන්න ගැන හෝ එය වර්තමාන තත්වයෙන් කෙසේ වෙනස් වේ ද යන්න ගැන හෝ ඔබ එතරම් පැහැදිලි නැති බව කිව යුතු ය. ඔබගේ යුතෝපියාව තුල පවුල කෙසේ වැඩ කරනු ඇත් ද යන්න ගැන ඔබගේ අනුගාමිකයන් යයි සිතා සිටින අයට සන්තෘප්ත වීමට සිදුවන්නේ සාමාන්‍ය ඇඟවීම් කිහිපයකින් පමනි. ආදරවන්තයින් අතර ද දෙමව්පියන් හා දරුවන් අතර ද ගැඹුරු ලිංගික හා ආවේගාත්මක බන්ධයන් පවතී. ඒවාට සාමූහික පවුලක් තුල ඉඩකඩ සැලසිය යුතු වේ. මේ අර්ථයෙන් ගත් කල්හි සාමූහික පවුල න්‍යෂ්ටික පවුල අහෝසි කරන්නේ නැත; ඒ වෙනුවට කෙරෙනු ඇත්තේ එය අපෝහකාර්ථයකින් අතික්‍රමනය කිරීම ය. එනම්, රොමැන්ටික ආදරය ද මාපිය-දරු ආදරය ද රැකගනිමින් ම ධනේශ්වර - සමාජය තුල - පවුල් ජීවිතය මෙතරම් මැ කාලකන්නි දෙයක් බවට පත්කරන පීඩක සම්බන්ධතා ද සමාජ පරාරෝපිත බව ද අහෝසි කර දැමීම ය."

බ්‍රෙනර් සහෝදරය, ඔබට පවුල පිලිබඳ ගැටලුව මුල් බැස ගෙන පවතින්නේ සාරභූත වසයෙන් ම සමාජ තතු තුල නො ව, පුද්ගල මානසිකත්වය තුල ය. ඔබගේ හතුරුකම එතරම්මැ එල්ල වී ඇත්තේ පවත්නා ආර්ථික පද්ධතියට නො ව, පවුලට එරෙහිව ය. ඔබ ඒත්තු ගෙන සිටින්නේ පවුල තමන් තුලින් ම දෘඪ කාලකන්නි භාවයක් ජනිත කරන්නේ ය කියා ය. එහෙයින් ඔබ සමාජවාදීන්ගෙන් ඉල්ලා සිටින්නේ වෙනස්, පරමාදර්ශී, සම්බන්ධතාවයක් - එනම් ඊනියා "සාමූහික පවුල" - අලුතින් නිපදවා ගෙන එය තමන්ගේ ක්‍රියා මාර්ගය තුල පිහිටුවා ගත යුතු ය කියා ය. මෙය මාක්ස් සහ එංගල්ස් විසින් මෙම ප්‍රශ්නය පිලිබඳව ගනු ලැබූ ආකල්පය සැලකිය යුතු අන්දමින් දුරාර්ථනයට භාජන කිරීමක් අවශ්‍ය කරයි.[20]

ඔබ මවා පාන දර්ශනයන් කොයි හැටි වෙතත්, කම්කරු පන්ති පවුල් වැඩි ගනනක ජීවිතවල යථා ස්වභාවය පිලිබඳව සාවද්‍ය තොරතුරු සහිතව ද, අති අසාමාන්‍ය නොතැකීමකින් ද ඔබ කටයුතු කරන බැව් පෙනේ. පවුල පිලිබඳ ක්ෂතියෙහි මනෝ විද්‍යාත්මක හා ලිංගික මානයන් මත ගැලී සිටින ඔබට, බොහෝ කම්කරු පන්තික පවුල් මුහුන දෙන ගැටලුවල ප්‍රායෝගික පැත්ත ගැන කියන්නට ඇති දෑ, කැපී පෙනෙන සුලු ලෙස ම අල්ප ය.[21] ගුනාත්මක දිවා සුරැකුම් (සේවාවන්) සඳහා සර්ව භෞමික ප්‍රවිෂ්ටයක ඉඩකඩ පිලිබඳව හුදු සඳහනක් කොට පසෙක ලනු පමනි. ඔබ කියන දෙයින් හැඟැවෙන්නේ, සමාජ පසුගාමීත්වයේ විවිධ රූපාකාරයන්ට එරෙහිව ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කරනු විනා, කම්කරු පන්තික පවුල්වල ජීවන තතු සැලකිය යුතු ලෙස වැඩි දියුනු කෙරෙන ප්‍රායෝගික පියවර ලෙස සමාජ විප්ලවයට ඉටු කල හැකි වැඩිමනත් දෑයක් නැති බවය. ඔබ මෙසේ ලියන්නෙහි යඃ "මෙම ප්‍රයුක්තියෙහි හරි මැද පිහිටා ඇති කරුන නම්, සමාජවාදය සපැමිනිය ද පවුල සම්බන්ධ ගැටලු ස්වයංසිද්ධව අහෝසි නොවීම යි."

කොයි කවර දෙයක් හෝ වේවා, ස්වයංසිද්ධව සිදු වෙතැයි කවරෙක් නම් සිතුවෝ ද? සමාජවාදී විප්ලවය වූ කලී යමෙකුගේ පරිගනකයක ස්වයංසිද්ධ ස්ථාපන ක්‍රමලේඛයක් දියත් කිරීම (launching of an auto-install program) වැන්නක් නො වේ. (බොහෝ විට සිදුවන පරිදි, එය ද පෙර නොදකින ලද දුෂ්කරතාවන්ගෙන් සපිරි ක්‍රියා දාමයකි.) එහෙත් පිලිස්තීනුවන්ට ඒ සා ආවේනික වූ මේ වර්ගයේ ප්‍රකාශයන්ගෙන් අරමුනු කෙරෙන්නේ, සකල ආකාරයේ මානුෂික දුක් පීඩාවන් අහෝසි කිරීමේ යතුර ඇත්තේ නූතන සමාජය පදනම් වී ඇති පවත්නා ධනේශ්වර දේපල සම්බන්ධතා පෙරලා දැමීම තුල බව පැවසෙන සමාජවාදයේ මූලික ඉදිරි දර්ශනයට අවමන් කිරීම ය. නිෂ්පාදන ක්‍රමයන්හි පෞද්ගලික අයිතිය විසින් මතු කෙරෙන මහා ගැටලුවට

ලබා දෙන විසඳුම, මිනිස් වර්ගයා මුහුන දෙන තතු පිලිබඳ සෙසු වැදගත් ගැටලු රාශියක් ක්‍රමානුකූලව විසැඳීම සඳහා මාවත හෙලිපෙහෙලි කොට දෙනු ඇත.

නැත. පවුල තුල සම්බන්ධතාවන්හි සියලු ගැටලු සමාජවාදයේ ප්‍රථම වසර තුල විසඳෙන්නේ නැත. ඇතැම්විට මුල් ශතවර්ෂය තුල පවා ඒවා නො විසඳෙනු විය හැකි ය. සමාජවාදය යටතේ සියලු විවාහයන් හෝ වෛවාහික හවුල්කරුවන් අතර සකල එකමුතුව ම හෝ තුෂ්ට දායක වනු ඇතැයි, නැත හොත් සියලු දරුවන් තම දෙමාපියන් පිලිබඳව ද, එහි අනෙක් අතට ද තෘප්ත වනු ඇතැයි සාධාරනව උපකල්පනය කිරීමට කවරෙකුට හෝ නො හැකි ය. එහෙත් අපට නිසැකව උපකල්පනය කල හැකි දෙය නම්, සමාජයේ ආර්ථික ව්‍යුහයේ, සමාජවාදයේ දිශානතිය ඔස්සේ කෙරෙන විප්ලවවාදී ප්‍රතිසංවිධානයක් මගින්, වත්මන් පවුල් මුහුන දෙන දුෂ්කරතා හා දුර්භාග්‍ය සම්පන්න තත්වයට ද හේතු පාදක වන ප්‍රධාන භෞතික හේතු සාධාරනව කෙටි කලක් තුල දී අහෝසි වනු ඇති බවයි.

නූතන සමාජවාදී වැඩ පිලිවෙලක් 21 වන ශතවර්ෂයේ ප්‍රථම දශකය තුල පිරිමින්, ගැහැනුන් හා දරුවන් මුහුන දෙනාකාර ගැටලු කෙරේ ප්‍රායෝගිකව යෙදීගත යුතු වේ. මව්වරුන්ගෙන් අතිමහත් වැඩි සංඛ්‍යාව තමන්ගේ නිවෙස්වලින් පිටත රැකියාවල්වල යෙදී සිටින තතු තුල ගැහැනිය "කුටුම්බගත වහල් භාවයෙන්" මුදා ගැනීමට ඔබ කරන සමර්පනය තරමක් අරුම ස්වභාවයක් ගනී.

"පියා තමයි හොඳින් දන්නේ" වර්ගයේ දෙමාපිය දෙන්නෙකු සහිත කුටුම්බයන්ගේ ප්‍රතිශතය අද දින 1950 ගනන්වල තිබුනු ප්‍රතිශත ප්‍රමානයෙන් සුලු පංගුවකට බැස තිබෙන බව ඔබ දැකගෙන ඇති පාටක් පෙනෙන්නට නැති ය. අධිකාරවාදී 'ගෘහපති පියා' පිලිබඳ චිත්තරූපය අද දින යථාර්ථයට - "ෆ්‍රෙන්ඩ් ඔෆ් කෝර්ට්" (උසාවියේ මිත්‍රයා) නමින් (එක්සත් ජනපදය තුල) කම්කරු පන්තික පියවරුන් නීතියේ නියපඳුරට සිරකර තබන නීතිමය වධක ක්‍රමයේ (මෙම නීතිය අනුව තමන්ගේ සතියක වැටුපෙන් හරි අඩක් තම දරුවන්ගේ නඩත්තුව සඳහා ගෙවීමට කම්කරු පන්තික පියෙකුට බලකල හැකිය.) ගොදුරු බවට පත්ව සිටින්නා වූ කම්කරුවන් මෙහි ලා සඳහන් කල යුතුව ඇත - කිසි සේත් ම සම්බන්ධතාවයක් ඇත්තේ නැත. වැඩ කරන පන්ති පවුල් තමන්ට ගැලවී ගත නො හැකි වූ මූල්‍ය දුෂ්කරතාවලින් වට කරනු ලැබ සිටිති. සමාජ ජීවිතයේ ඉමහත් සංකීර්නභාවය ද එය පවුල් මත තබන්නා වූ බර ද ඉල්ලා සිටින්නේ නව වර්ගයේ පවුල් ආකෘතියක් නිර්මානය කර ගැනීම නොව දැන් මුලුමනින් ම පාහේ පුද්ගලයන් මත ට පැවැරෙන බරබද්දල් සමස්තයක් වසයෙන් සමාජය මත ට බාර ගැනීම ය.

එහෙත් බ්‍රෙනර් සහෝදරය, පවුල පිලිබඳව ඔබ කරන්නා වූ සාකච්ඡාවේ අර්ථභාරය වන්නේ -ඔබ ඉදිරිපත් කරන ඉල්ලීම්වලට වඩා - සමකාලීන නව යුතෝපියානුවාදයේ සම්පූර්න විඥානවාදී දෘෂ්ටිය සහ විධික්‍රමය මත එම ඉල්ලීම් මගින් නො දැනුවත්ව ම හෙලනු ලබන ආලෝකය යි. ඔබ පුනපුනා කියන්නේ පවුල වනාහි සමාජ පසුගාමිත්වයේ කොටු පවුර බව යි. එමගින්, සෑම විටම මෙන්ම දැනුදු, ඔබ මෙම පසුගාමිත්වයේ උල්පත දැකගන්නේ සමාජයේ ආර්ථික සංවිධානය තුල නො ව, පුද්ගලික මානසිකත්වය, විශේෂයෙන් ම මනුසතාගේ "කැටි ගැසුනු අපරීක්ෂිත අතීතය" ක් තුල දිගින් දිගටම පවතින්නා වූ "උප විඥානයේ අවරෝධිත වේදනයන්" තුල ය. පසුගාමිත්වය ජයගැනීමේ දී සමාජයේ ආර්ථික සංවිධානය සහ ව්‍යුහයේ ඇති වන විපර්යාසයන් තීරනාත්මක වනු ඇතැ යි යන මතයට විරුද්ධ වන ඔබ, එම පසුගාමිත්වය, "රැකී පවතිමින් දිගින් දිගටම රැඳෙනු ඇතැ" යි කියා සිටී. ඔබට අනුව (ඒවා ජයගැනීමට) "වෙනත් වර්ගයක මැදිහත්වීමක් උවමනා කෙරේ: "*මෙම සාකච්ඡාවේ මුලු අධ්‍යාසයම වන එම මැදිහත්වීමේ අන්තර්ගතය එයයි; - ලිංගික පීඩනයට එරෙහි අරගලය හා පවුලේ සමාජවාදී පරිවර්තනය - මානව පෞරුෂයේ මූලයෙහි පවත්නා ගැටලු විසඳලීමට එකම මග නම් මනුසතුන් ඇති දැඩි කරන්නා වූ ආකාරය වෙනස් කිරීම වන හෙයිනි.*" (අවධාරනය ඇඳිනි.)

ඔබගේ පර්යාලෝකය ද විප්ලවවාදී සමාජවාදී ව්‍යාපාරයේ පර්යාලෝකය ද අතර පවත්නා අගාධය ඊට වඩා පැහැදිලිව කිව නොහැකි වේ. ඔබගේ යෝජනා සහ පර්යාලෝකය පිලිගනු ලැබී නම් එහි ප්‍රතිවිපාකය වනු ඇත්තේ සසපය, ජාත්‍යන්තර කමිටුව සහ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය දියකර හැරීම යි. සමස්ත සමාජ-ආර්ථික පද්ධතිය පාලනය කරන්නා වූ වෛෂයික නීති පිලිබඳ සිය දැනුවත් වැටහීම වර්ධනය කර ගැනීම මත පදනම්ව ජාත්‍යන්තර කම්කරු පන්තිය විප්ලවවාදී - මූලෝපායික දිශාවකට යොමු කිරීම අරමුනු කර ගත්තා වූ ජාත්‍යන්තර පක්ෂයක් උදෙසා අවශ්‍යතාවයක් නො පවතිනු ඇත. එවිට ජාත්‍යන්තර කමිටුව, තම සාමාජිකයන් සහ ආධාරකරුවන්ගේ " උපවිඥානය තුල කැටි වී ඇති අවරෝධිත හැඟීම්" පරීක්ෂා කරමින් ද පවුල් ව්‍යුහය තුල ගැබ් වී ඇතැ යි ඔබ විශ්වාස කරන ලිංගික ශංකාවන්ට ආමන්ත්‍රනය කරමින් ද වැඩ කර ගෙන යන මනෝචිකිත්සක සංවිධානයක් විසින් විස්ථාපනය කෙරෙනු ඇත.

මෙම ගැඹුරින් ම නොමග ගිය පර්යාලෝකයේ ප්‍රතිගාමී හා සිත් ඉතා සසල කරන ගම්‍යයන්ට අප මඳක් පසු වී යලි එලඹෙන්නෙමු. එහෙත් ඔබගේ තර්කයේ සෝර ප්‍රතිඝතිතාවය අප විසින් සලකුනු කර ගත යුතුව ඇත. ඔබ කියන පරිදි සමාජ පසුගාමිත්වය අහෝසි වී යාම මනෝ-ප්‍රතිස්ථාපනයේ, පෞරුෂ ප්‍රතිනිර්මානයේ සහ කුටුම්බ (පවුල්) ප්‍රතිවර්තනයේ යෝධ වැඩ පිලිවෙලකට නො අඩු දෙයක් ඉල්ලා සිටී නම් මෙම පෙර නුවූ විරූ සමාජ ප්‍රතිඒකාග්‍රකරනයේ

ව්‍යාපෘතිය ඉටු කර ගත හැකි එකම මග වූ විප්ලවය ම සාක්ෂාත් කල හැකි වන තැනට මහජනතාවගේ විඥානය කවර කලෙකත් ඔසොවාගත හැකි වන්නේ කෙසේ ද? ඔබට අනුව, ඔවුන්ගේ හැදී වැඩීම නිසා ම මානසික වසයෙන් තුවාල වූ මිනිසුන්ගෙන් සමන්විත සමාජයක් තුල, බ්‍රෙනර් සහෝදරය, සමාජවාදය ජනතා ව්‍යාපාරයක් බවට පත්විය හැක්කේ කෙසේ ද? ඔබට මෙම පරස්පරය විසඳගත නොහැකි ය. ඒ වෙනුවට ඔබ පැරනි යුතෝපියානුවන්ගේ අනයිතිහාසික සංකල්පනයන් අලුතින් ඉදිරිපත් කරමින් එය තවතවත් ගැඹුරු කරන්නෙහි ය. පැරනි යුතෝපියානුවන් කලාක් මෙන් ඔබ ද "මානව පෞරුෂයේ මුල ම පවත්නා ගැටලු විසඳලීමට එකම මග නම් මිනිසුන් හදාවඩා ගනු ලබන ආකාරය වෙනස් කිරීමය" යි කියා සිටින්නෙහි ය. වෙනත් වචනවලින් කිවහොත් අප ඔවුන්ට වෙනත් වර්ගයක පවුලක් සපයා දිය යුතු ය. එහෙත් - සුපැහැදිලි හේතු නිසා මෙය සමාජවාදී විප්ලවයට පෙරාතුව ඉටු කල හැක්කක් නො වන හෙයින් බලය අල්ලා ගැනීම දැන් සිටිනා ආකාර මිනිසුන්ගේ ක්‍රියා මගින් කලයුතුව ඇත. පෙනී යන යන හැටියට නම් මෙය විප්ලවයක් කිරීමේ හැකියාවට ඉඩක් නො තබන බව ය. එහෙත් කිසියම් හාස්කමකින් මේ සකල සියලු තුවාලකාර මනුසතුන් ධනවාදය පෙරලා දැමීමට සමත් වුව හොත්, එවිට එම මිනිසුන් අලුත්වැඩියා කොට අලුතින් උගන්වා ගත යුතු වේ. සමාජය දුවවීම "සැලකිය යුතු කාල පරිච්ඡේදයකට" වට්ටෝරුගත විඥානයකින් කල්තබා අධ්‍යාපිත වූ පුහුනු කරන ලද සමාජවාදීන් අත තැබිය යුතු යයි යන ඔබගේ පරිඥානය තර්කානුකූලව ගලා එන්නේ ඔබගේ ම විඥානවාදී මනෝරටාවෙනි.[22]

## මතු සම්බන්ධයි

## සටහන්

18. ට්‍රොට්ස්කි මෙම සන්තතිය මෙසේ විස්තර කලේ යː " විප්ලවීය යුගයක දී ජනතාවගේ අදහස්වල සහ මනෝභාවයන්ගේ ශීඝ්‍ර වෙනස්වීම් ප්‍රභවය ලබන්නේ මිනිසාගේ මනසේ පවත්නා නම්‍යශීලිත්වයෙන් සහ සංචලතාවයෙන් නොව, එහි පරිපූර්න අනෙක් පැත්ත වන මිනිසාගේ උග්‍ර කොන්සර්වේටිව්වාදයෙනි. හුදෙක් 'මැත දොඩන්නන්ගේ' ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස පොලිස්කාර මනසකට පෙනී යන්නා වූ, විප්ලවීය යුගයක සිදුවන අදහස්වල සහ චිත්ත වේගයන්වල පිම් පැනීම්වලින් යුතු ගමන බිහි කරන විප්ලවීය කාල පරිච්ඡේදයන් නිර්මානය කරන්නා වූ දෙය නම්, ව්‍යසනයක ආකාරයෙන් ජනතාව මත එය කඩා වැටෙන තුරා ම නව විෂයමූල තත්වයන් පිටුපස අදහස් සහ සම්බන්ධතාවයන් නිදන්ගත ලෙස ලැග සිටීම ය." (*රුසියානු විප්ලවයේ ඉතිහාසය*, වෙලුම 1; 2001; පි. xvii)

19. *එංගල්ස්, සමාජවාදය මනෝරාජ්‍යයෙන් විද්‍යාවට*

"ඉකුත් ආර්ථික තත්වයන්ට අනුරූප වූ සමාජ ක්‍රමය නිෂ්පාදනයේ සහ හුවමාරුවේ නිහඬව ඇතිවී තිබෙන වෙනස්කම් විසින් දැන් තවත් දුර අනුරූප නොවන බව සනාථ කරයි. පවතින සමාජ ආයතන යුක්ති යුක්ත නොවේ යැයි ද, අසාධාරන යැයි ද "යුක්ති යුක්තය තේරුම් රහිත බවටත්, ප්‍රීතිය වේදනාව බවටත් පෙරලී ඇත" යි ද යන වර්ධනය වෙමින් පවතින මතය සනාථ කරයි. හෙලිවී ඇති ලක්ෂනවල අසමානතාවයන් ඉවත් කැරැලීමේ මාධ්‍යයන් එම නිෂ්පාදන ක්‍රමවල ම අඩුවැඩි වසයෙන් සංවර්ධනය වූ තත්වයන් පවතින බව මෙයින් ස්ථිර වෙයි. මෙම මාධ්‍යයන් සොයා ගත හැක්කේ පවතින නිෂ්පාදන ක්‍රමයට අනුරූප වන කටුක සත්‍ය කරුනුවලිනි, එමෙන්ම ඒවා වියුක්ත ලෙස චින්තනයෙන් ලබා ගත හැකි දේ නොවේ.

"...නව නිෂ්පාදන බලවේග, ඒවා පාවිච්චියට ගන්නා ධනවාදී රූපිකය ඉක්මවා වැඩී සිටී. ජන්ම පාපය සහ දේවමය සාධාරනත්වය අතර වූ ඝට්ටනය මෙන් නොව, මෙම නිෂ්පාදන බලවේග සහ නිෂ්පාදනක්‍රම අතර ඇති මෙම ඝට්ටනය මිනිස් මොලයෙහි වියුක්ත ලෙස බිහි වූවක් නොවේ. එය සැබැවින්ම, යථාර්ථවාදී ලෙස, අපෙන් පරිබාහිරව, එය නිර්මානය කල මිනිසුන්ගේ අභිප්‍රායෙන් හා ක්‍රියාවලින් පවා ස්වාධීනව පවතී. සමකාලීන සමාජවාදය යනු වෙනත් දෙයක් නොව, යථාර්ථවාදී ලෙස පවතින මෙම ඝට්ටනය චින්තනයෙන් පරාවර්තනය වීම ය. ධනපති පන්තිය යටතේ කෙලින්ම පීඩාවට පත් වී සිටින පන්තියේ එනම් කම්කරු පන්තියේ මොලවල එය පරමාදර්ශයක් සේ පරාවර්තනය වීම ය." ( *මාක්ස් සහ එංගල්ස් තෝරා ගත් කෘති වෙලුම් හතර*, වෙලුම 3, මොස්කව් 1982, පිටු 89-90)

20. "පවුල අහෝසි කිරීම සහ විවාහය නීතිගත කරන ලද ගනිකා වෘත්තියය"යි හෙලා දැකීම මගින් මාක්ස් සහ එංගල්ස්, " වික්ටෝරියානු යුගයේ හුස්ම හිර කරවන සදාචාරයට විවෘතව ම විරුද්ධ වූහ" යි ඔබ කියා පායි. මාක්ස් සහ එංගල්ස් ගෙන් සෘජුව ගෙන හැර දක්වන්නේ නැතිව ම ඔබ ඔවුන්ගේ ලේඛන නුහුරු කෙනෙකුට යෝජනා කර සිටින්නේ ඔවුන් දෙදෙනා සකල පවුල් සබඳතා දිය කර හැරීමට පක්ෂපාතව සිටි බව ය, සාර්වත්‍රික නිදහස් ආලය යනාදිය වෙනුවෙන් පෙනී සිටි බව ය. මෙය අතිශයින්ම ප්‍රතිගාමී සාහිත්‍යය තුල දක්නට ලැබෙන කොමියුනිස්ට්වාදයේ විකෘත රූපයට සම්පාත වෙයි. සත්‍ය වසයෙන්ම නම්, මාක්ස් සහ එංගල්ස් *කොමියුනිස්ට් ප්‍රකාශනයේ* දී පවුල අනයිතිහාසික වියුක්තයක් ලෙස නො සැලකූහ. ඒ වෙනුවට ඔවුහු පහත සඳහන් ප්‍රශ්නය මතු කලෝ යː "සමකාලීන, ධනවාදී පවුල, පදනම් වී තිබෙන්නේ කුමන අත්තිවාරමක් මත ද?" ඔවුහු මෙසේ පිලිතුරු දුන්හː

"ප්‍රාග්ධනය මත ය. පෞද්ගලික ලාභය මත ය. සම්පූර්න ලෙස වර්ධනය වූ ස්වරූපයකින් මේ පවුල පවතින්නේ ධනපති පන්තිය සඳහා පමනකි. එහෙත් මේ තත්වයෙහි අනුපූරකය වී ඇත්තේ නිර්ධනීන් අතර නියම පවුල් ජීවිතයක් නොමැති වීමත් ප්‍රසිද්ධ ගනිකා වෘත්තියක් තිබීමත් ය.

"මේ අනුපූරකය අතුරුදහන් වන විට, ධනවාදී පවුල ද ස්වභාවයෙන්ම අතුරුදහන් වෙයි. ප්‍රාග්ධනය අතුරුදහන් වීමත් සමග ම මේ දෙක ම අතුරුදහන් වන්නේ ය." (මොස්කව්, 1980 54 පි. අවධාරනය එකතු කරන ලදි.)

එසේම මාක්ස්ගේ සහ එංගල්ස් කතා කරන්නේ විවාහය ගැන පොදුවේ නොව, ධනේශ්වර විවාහය ගැන ය. ඔවුන් මෙම ප්‍රයුක්තියට අත ගසන්නේ කොමියුනිස්ට්වාදීන්ගේ අරමුන නම් "ස්ත්‍රීන්ගේ ගනිනිකත්වයක්" ඇති කිරීම ය, එනම් ස්ත්‍රීන් පොදු අන්තඃපුරයක සාමාජිකාවන් බවට පත් කිරීමය යනුවෙන් කරන ධනේශ්වර කියාපෑම විහිලුවට භාජන කොට ඉවත ලීම ය. මාක්ස් හා එංගල්ස් මෙසේ පිලිතුරු දෙතිː

"ධනපතියා සිය බිරිඳ සලකන්නේද හුදෙක් නිෂ්පාදන උපකරනයක් ලෙසට ය. සියලු නිෂ්පාදන උපකරන පොදුවේ පාවිච්චි කිරීමට යන බවක් ඔහුට ඇසෙයි. ඒ අනුව

ස්වභාවයෙන් ම පොදු පරිභෝජනයේ ඉරනම එලෙසම ස්ත්‍රීන්ට ද බලපාතියි යන අවහස හැර වෙනත් දෙයක් සිතා ගැනීමට හේ අපොහොසත් වෙයි.

"ස්ත්‍රීන් හුදෙක් නිෂ්පාදන උපකරන පමනක් හැටියට සිටීමේ තත්වයෙන් ඔවුන් මුදාලීම අපේ අරමුන යැයි අනුමාන වසයෙන් කල්පනා කිරීමට තරම්වත් ඔහුට ශක්තියක් නැත.

"කොමියුනිස්ට්වරුන් නිල වසයෙන් පිහිටුවාලීමට යතියි ධනපතීන් කියන ස්ත්‍රීන් පොදුවේ පරිභෝජනය කිරීමේ ක්‍රමය කෙරෙහි ධනපතීන් දක්වන උසස් අධ්‍යාත්මික කෝපයට වඩා හාස්‍යජනක දෙයක් තවත් නැත. ස්ත්‍රීන් පොදුවේ පරිභෝජනය කිරීම කොමියුනිස්ට්වරුන්ට අලුතින් ඉදිරිපත් කිරීමට වුවමනාවක් නැත. එය අනාදිමත් කාලයක සිට පැවත එන්නකි.

"ධනවාදී විවාහය සැබැවින්ම පොදු භාර්යා ක්‍රමයකි. එබැවින් කොමියුනිස්ට්වාදීන්ට විරුද්ධව ධනපතීන්ට කල හැකි උපරිමය දෝෂාරෝපනය වන්නේ වංචනික ලෙස සඟවා ඇති පොදු භාර්යා ක්‍රමය නිල වසයෙන් විවෘත ලෙස කිරීමට යන්නේ ය කියා ය. වත්මන් නිෂ්පාදන ක්‍රමය අහෝසි කර දැමීමත් සමග ම ඒ සමාජ ක්‍රමයෙන් පැන නැගි පොදු භාර්යා ක්‍රමයත්, එනම් ප්‍රසිද්ධියේ සහ අප්‍රසිද්ධියේ කැරෙන ගනිකා වෘත්තියත් අහෝසි විය යුතු යැයි මින් ප්‍රත්‍යක්ෂ ලෙස ම පැහැදිලි වෙයි." (එම 55 පිට)

*කොමියුනිස්ට්වාදයේ මූලධර්ම, මැයෙන් කොමියුනිස්ට් ප්‍රකාශනයට සමාන්තරව ලියන ලද තවත් ලිපියක එංගල්ස්"* කොමියුනිස්ට් සමාජ පර්යායක් පවුල මත කෙවන් බලපෑමක් ඇති කරයි ද?" යන ප්‍රශ්නයට මෙසේ පිලිතුරු දෙයි.

"ස්ත්‍රී පුරුෂ සබඳතාවය විශේෂයෙන්ම පෞද්ගලික දෙයක් වනු ඇත. එය ඒ ඒ පුද්ගලයන් සතු කාර්යයක් මිස, එයට අත පෙවීමට සමාජයට කිසිදු වුවමනාවෙක් නැත. මෙය මුදුන්පමුනුවා ගත හැක්කේ, පෞද්ගලික දේපොල අයිතිය අහෝසි කැරැලීමෙන් සහ ලමයිනට සමාජීය ශික්ෂනයක් ලබා දීම මගිනි. මෙහි ප්‍රතිඵලයක් වසයෙන්, පෞද්ගලික දේපොල අයිතියට සම්බන්ධ වූ පුරුෂයාට ස්ත්‍රිය යටවීම ද, ලමයින් දෙමාපියන්ට යටවීම ද සහිත සමකාලීන විවාහයේ පදනම් දෙකක් අහෝසි වනු ඇත. ගැහැනුන් කොමියුනිස්ට්වාදී ලෙස පොදුවේ තබා ගනිතියි බෙරිහන්දෙන උසස් සදාචාරයකින් හෙබි අවරසිකයින්ට පිලිතුර මෙයයි. ගැහැනුන් පොදුවේ තබා ගැනීම සම්පූර්නයෙන් ම ධනවාදී සමාජයේ ලක්ෂනයකි. සමකාලීන සමාජයේ ගනිකා වෘත්තිය මගින් මෙය පූර්න ලෙස ක්‍රියාවේ යෙදෙමින් පවතී. පෞද්ගලික දේපොල අයිතිය අහෝසි වනවාත් සමග එහි පදනම මත පවතින ගනිකා වෘත්තියද අහෝසි වනු ඇත. මේ හේතුන් නිසා කොමියුනිස්ට්වාදී සමාජය ගැහැනුන් පොදුවේ තබා ගන්නවා වෙනුවට එය සම්පූර්නයෙන්ම අහෝසි කරලයි. (එම 91 පිටුව)

21. පෝසත්ම ධනේශ්වර රටවලට පිටස්තරව ජීවත්වන පවුල්වල උවමනාකම් ගැන ඔබ සිතා ඇති බවක් ඔබේ ලිපියෙන් කිසි සේත් ම පෙනීයන්නේ නැත.

22. සමාජයේ ප්‍රතිවර්තනය රඳා පවත්නේ වෙනස් වන්නා වූ මානුෂික පෞරුෂය (එනම් මානව ස්වභාවය) මතය යන්න ද, අනෙක් අතට එයම (එම පෞරුෂයම) හැඩ ගස්වා ලන්නේ මිනිසුන් හදාවඩා ගැනීමේ ක්‍රියාවලිය විසින් ය යන්න ද යන මේ කරුනු අධ්‍යාපකයන් විසින් නියම කරන ලද මූලධර්ම මත තරුනයන්ගේ අධ්‍යාපනය පවත්වා ගෙන යන තමන්ගේ ම සමාජයන් සංවිධානය කිරීමට යුතෝපියානුවන් ද ඔවුන්ගේ අනුගාමිකයන් ද ගත්තා වූ පියවරයන් ට පදනම් විය. එහෙත් අන්තිමේදී මෘතාන්තයන්ට මග පෑදූ මේ අත්හදා බැලීම් පදනම් කර ගනු ලැබුවේ සමාජ සංවර්ධනය පිලිබඳ සාවද්‍ය සංකල්පයන් මත ය. මාක්ස් *ෆොයර්බාක් පිලිබඳ තම තුන්වන ප්‍රවාදයේ* දී මෙම යුතෝපියානු මිථ්‍යාව තියුනු විවේචනයකට භාජනය කලේ යඃ "මනුෂ්‍යයෝ වනාහි පරිසරයේත් ශික්ෂනයේත් නිෂ්පාදනයෝ ය; එහෙයින් වෙනස්වූ මිනිස්සු වනාහි වෙනත් පරිසරයන්ගේත් වෙනස් ශික්ෂනයන්ගේත් නිෂ්පාදනයෝ ය යන භෞතිකවාදී මතය පරිසරය වෙනස් කරන්නේ මිනිසුන් ම බවත් ශික්ෂකයා ම ශික්ෂිත කල යුතු බවත් අමතක කරයි. එහෙයින් මෙම මතය අනිවාර්යයෙන් ම සමාජය කොටස් දෙකකට බෙදෙයි. (නිදසුන් වසයෙන් රොබට් ඕවන් සැලකුවාක් මෙන්) මේ දෙකොටසින් එකක් සමාජයට වඩා උත්තරීතර වේ.

පරිසරය වෙනස් කිරීමත් මානුෂික ක්‍රියාකාරිත්වයත් යන මේ දෙකේ සම්පාතය සිතා ගත හැක්කේත් තර්කානුකූල ලෙස වටහා ගත හැක්කේත් විප්ලවකාරක භාවිතය වසයෙන් පමනකි." (*ලුඩ්විග් ෆොයාබාර්ක් හා සම්භාව්‍ය ජර්මානු දර්ශනවාදයේ අවසානයඃ* කාල් මාක්ස් ෆොයාබාර්ක් ගැන ප්‍රවාද 3, පිටුව 62, කම්කරු මාවත ප්‍රකාශන)

© www.wsws.org